DOI : 10.31357/fhssmst.2006.00655

# ද්විතියික අධ්‍යාපනය කෙරෙහි

# බලපාන

# සමාජ හා මනෝමූලික සාධක

# (හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ පාසැල් ඇසුරින්)

නම : එච්. ආරියවති

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ පාර්ශ්වීය අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා 2006.02.17 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධය.

## ස්තුතිය

මේ අධ්‍යාපන කටයුතුවලදී සැම විටම උපදෙස් ලබා දෙමින් ද, ගැටළු සාකච්ඡා කරමින්ද එළදායි අදහස් ඉදිරිපත් කිරීමෙන් ද සිය වටිනා කාලය කැප කරමින් මාර්ගෝපදේශකත්වය සැපයූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා ගුරු පියාට මගේ ගෞරවණීය ස්තුතිය පිරිනැමේ.

අධ්‍යයනය ආරම්භයේ සිටම නිරතුරුව මාර්ගෝපදේශකත්වය සපයමින් මාව දිරිගැන්වූ සමාජ හා මානව විද්‍යා අංශ ප්‍රධාන ස්වර්ණා පෙරේරා මහත්මිය ඇතුළු කථිකාචාර්ය ජයන්ත ජයසිරි, උදය කුමාර, ප්‍රනීත් අබේසුන්දර මහත්වරුන් ඇතුළු කථිකාචාර්ය මණ්ඩලයත් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

විශේෂයෙන් මෙම නිබන්ධනයේ කටයුතු සාර්ථකව නිම කර ගැනීමට සහාය දුන් වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ අධ්‍යක්ෂතුමන්ලාටත්, විදුහල්පතිතුමන්ලාටත්, තොරතුරු හා දත්ත සපයා ගැනීමේදී නිරතුරුව සහය දුන් හ / කරුදෙනිය ක. විද්‍යාලයාධිපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත් හෘදයාංගම ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

මෙම භාරදූර කාර්යයෙහිදී ඉමහත් කැපවීමකින් මාව දිරිගැන්වූ දුව ඉන්දීවරී, සාරංග හා නිරංජන් දූ දරුවන්ටත් පරිගණක කටයුතු හා මුද්‍රණ කටයුතු කර ගැනීමේදී නිබඳව සහය දුන් රංජිත් ඒකනායක සොයුරාටත්, හක්මන කොම්ටෙක් ආයතනයේ කාර්ය මණ්ඩලයටත් කෘතඥතා පූර්වක ස්තුතිය මින් පිරිනමමි.

## කතෘගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය ශාස්ත්‍රපති / සමාජ විද්‍යා උපාධි පරීක්ෂණයේ පාර්ශ්වීය අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීම සඳහා සකස් වුවකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යනාංශයේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරන ලද්දකි. මෙහි අන්තර්ගත සෑම දත්තයක්ම, මූලාශ්‍රයක්ම ග්‍රන්ථ, සඟරා, පර්ශීලනය කිරීමෙන් හා නියැදි සමීක්ෂණයකින් ලබාගත් බවත්, මෙය පෙර කිසිදු පශ්චාත් උපාධියක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් මෙයින් සහතික කරමි.

එච්. ආරියවති

දිනය :- 2005.12.10

## උපදේශකවරයාගේ සහතිකය

සමාජ විද්‍යාව ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා එච්. ආරියවති විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබූ බවත් මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගැයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බවත් තවදුරටත් මෙයින් සහතික කරමි.

....................................................

මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා

ප්‍රධාන උපදේශක

දිනය : 2006/[illegible]/31

14 NOV 2006

## පටුන


පිටුව

1 වන පරිච්ඡේදය 1-9

1.1 හැඳින්වීම

1.2 අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ

1.3 අධ්‍යයනයේ වැදගත්කම

1.4 මූලාශ්‍ර හා ක්‍රමවේදය

1.5 ගැටළු හා සීමාවන්

2 වන පරිච්ඡේදය 10-19

2.1 ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ක්‍රමයේ විකාශනය හා ද්විතියික අධ්‍යාපනයේ ස්වභාවය

2.2 අධ්‍යාපනය යනු කුමක්ද ? 20-34

2.3 අධ්‍යාපනයෙහි අපේක්ෂිත කාර්යභාරය

2.4 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය හා පාසල් ව්‍යුහය

3 වන පරිච්ඡේදය 35-47

ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනය කෙරෙහි බලපාන ලද සාධක

4 වන පරිච්ඡේදය 48-88

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ තෝරා ගන්නා ලද පාසල් වල ද්විතියික අධ්‍යාපන පහසුකම් පිළිබඳ විශ්ලේෂණය

5 වන පරිච්ඡේදය 89-103

පාසල් වර්ගීකරණයන් ද්විතියික අධ්‍යාපනය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ දත්ත විග්‍රහය

6 වන පරිච්ඡේදය

| | |
|---|---|
| සමාලෝචනය | 104-108 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 109-113 |
| උපග්‍රන්ථ 01 | 114-118 |
| උපග්‍රන්ථ 02 | 119-123 |

## සංඛ්‍යා වගු හා ප්‍රස්තාර සටහන් සංඛ්‍යා වගු


| සංඛ්‍යා වගු | | පිටු අංකය |
|---|---|---|
| 01. | වලස්මුල්ල අධ්‍යාපන කලාපීය සංවර්ධන සැලසුම් ඒකකය - 2002 | 7 |
| 02. | වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ පාසල් අතරින් තෝරා ගත් පාසල් | 8 |
| 03. | ද්විතියික පාසල් ව්‍යුහය | 29 |
| 04. | අධ්‍යාපන අමාත්‍යාංශය සංගණන වාර්තා 1998 | 30 |
| 05. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පළමු වැනි වාර්තාව අංක 05 සැසි වාර්තාව 1992 | 32 |
| 06. | වලස්මුල්ල අධ්‍යාපන කලාපීය සංවර්ධන ඒකකය 2002 | 49 |
| 07. | වලස්මුල්ල අධ්‍යාපන කලාපීය සංවර්ධන සැලසුම් ඒකකය 2002 | 50 |
| 08. | වලස්මුල්ල අධ්‍යාපන කලාපීය සැලසුම් ඒකකය 2002 | 50 |
| 09. | මූලාශ්‍රය 1998 අධ්‍යාපන අමාත්‍යාංශය සංගණන වාර්තාව | 51 |
| 10. | කටුවන අධ්‍යාපන කොට්ඨාශයේ සංගණන වාර්තා 2002 තෝරාගත් පාසල් 04 ශිෂ්‍ය සංයුතිය | 53 |
| 11. | කටුවන කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලීය කලාපීය වාර්තා 2002 | 55 |
| 12. | තෝරාගත් පාසල්වල ගොඩනැගිලි සම්පත් | 58 |
| 13. | තෝරාගත් පාසල්වල කෘෂිකර්ම විද්‍යා උපකරණවල සංයුතිය | 60 |
| 14. | තෝරාගත් පාසල් සතු ක්‍රීඩා භාණ්ඩ සංයුතිය | 64 |
| 15. | තෝරාගත් පාසල්වල ලිබඩු උපකරණ වල සංයුතිය | 65 |
| 16. | සෞන්දර්ය භාණ්ඩවල සංයුතිය, චිත්‍ර කර්මය | 67 |
| 17. | තෝරාගත් පාසල්වල සංගීත භාණ්ඩවල සංයුතිය | 68 |
| 18. | තෝරාගත් පාසල්වල නැටුම් භාණ්ඩවල සංයුතිය | 69 |
| 19. | තෝරාගත් පාසල්වල ගෘහ ආර්ථික විද්‍යා භාණ්ඩවල සංයුතිය I | 72 |
| 20. | තෝරාගත් පාසල්වල ගෘහ ආර්ථික විද්‍යා භාණ්ඩවල සංයුතිය II | 74 |

21. තෝරාගත් පාසල්වල ප්‍රා. තා. කු. විෂය සඳහා වූ භාණ්ඩවල සංයුතිය. 76

22. නියැඳිය ලෙස තෝරාගත් පාසල්වල සාධන මට්ටම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල 80

23. නියැඳිය ලෙස තෝරාගත් පාසල්වල සාධන මට්ටම අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල 80

24. අ.පො.ස (උ.පෙළ) කලා ප්‍රතිඵල 80

25. අ.පො.ස. (උ.පෙළ) වාණිජ ප්‍රතිඵල 81

26. ලංකාවේ පාසල් පද්ධතිය තුළ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2000 91

27. ශ්‍රී ලංකාවේ ද්විතියික පාසල් ව්‍යුහය - අධ්‍යාපන ප්‍රතිපත්ති හා පරිපාලනය 1988 91

28. අධ්‍යාපන අමාත්‍යාංශය සැළසුම් ඒකකය 1998 94

# පළමුවැනි පරිච්ඡේදය

1.1 හැඳින්වීම

1.2 අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ

1.3 අධ්‍යයනයේ වැදගත්කම

1.4 මූලාශ්‍ර හා ක්‍රමවේදය

1.5 ගැටළු හා සීමාවන්

## 1.1 හැඳින්වීම

සම්පූර්ණ මිනිසෙකු බිහි කිරීමේ ආධ්‍යාශයෙන් කෙරෙන ශාරීරික බුද්ධිමය භාවාත්මක හා ගුණාත්මක සංකල්ප අධ්‍යාපනයේ පොදු අරමුණු වශයෙන් විග්‍රහ කළ හැකිය. අධ්‍යාපනයේ ජාතික සංවර්ධනයක් කරා යොමු කිරීමේ කර්තව්‍යයේදී අධ්‍යාපනය නිසා පොදු හික්මීමත්, තිරණ ගැනිමේ ශක්තියත් හා සමාජිය වගකීම් වලින් ඈත්වීමට අද බොහෝ දුරට පෙළඹී තිබේ. කුඩා දරුවන් ළාබාල වයසේදීම තියුණු තරඟකාරී තත්ත්වයකට ඇද දමා ඇත. ජාතික අනන්‍යතාවය ආගමික ප්‍රවණතාවන් තම පෞද්ගලික ආර්ථික දියුණුව වැනි උග්‍ර පෞද්ගලික ප්‍රශ්න වලට යට නොවී සම්පූර්ණ ව්‍යුහය දෙස නිදහස්ව හා මධ්‍යස්ථව බැලීමට අවශ්‍ය ශක්තිය කෙනෙකුට අධ්‍යාපනයෙන් ලැබිය යුතුය.

මෙසේ අවශ්‍ය ශක්තිය ලබාදෙන ආකාරයට නූතන අධ්‍යාපනය හැඩ ගැසී නැත. එබැවින් අනාගත පරපුරට සිය ජිවිත ප්‍රශ්න වලට විසඳුම් ලබා ගත හැකි පදනමක් ඇති කිරීමේ කාලය එළඹී ඇත. අධ්‍යාපනය වනාහි අනාගතය අපේක්ෂා කරගෙන සකස් විය යුතුය. විශේෂයෙන්ම බාල පරපුර සඳහා අධ්‍යාපනය ලබා දිය යුත්තේ අනාගතයේදී ඔවුනට මුහුණපෑමට සිදුවන ජිවන අභියෝගයන්ට මුහුණදීමට ඔවුන් තුළ ශක්තියක් ඇති කරන ආකාරයට වේ.

දැනට ලංකාවේ අනන්‍යතාවය ඔස්සේ ඉතිහාසය විසින් නිර්මාණය කර දී ඇති උරුමය බරපතල ලෙස පලුදුවෙමින් ගැටුම් හා භේදකාරී පරිසරයක් දිවයිනෙහි එක් පසෙක වසර ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පවති. මෙම සමාජය එකිනෙකට යම් යම් වගකීම් වලින් බැඳුනු සංවිධානයකි. තම තමන්ගේ සමාජමය අගයන් හා වගකීම් ද අනුන් වෙනුවෙන් කළ යුතු මෙහෙවරක්ද ඇති බව හැමදෙනාම සිතිය යුතු වේ. මේ සඳහා පාසලේ අධ්‍යාපන අවස්ථා ඇති කර බාල පරපුර තුළ සාධාරණ ආකල්ප චර්යා රටා ඇති කළ යුතුය.

පුරවැසියෝ විවිධ පරිසරවල වෙනස් වූ ජීවනෝපාය ක්‍රමයක් මත ජීවත් වෙති. ජීවිතය තමන්ට මෙන්ම අනුන්ටද බරක් නොවිය යුතුවා සේම ළඟා කර ගත නොහැකි ඉලක්කය ඔස්සේ හඹායමින් වල්මත් නොවිය යුතුය. කැළඹිලි සහිත නොවිය යුතුය. පාසලට මේ සඳහා බොහෝ දේ කළ හැකි වන්නේ අරමුණු ගත වූ විටයි. සාරධර්ම උකහා ගැනීමේ අවබෝධය හා සංවේදිතාව ඇති කිරීම තමා හා අනුන්ගේ අභිවෘද්ධීන් සඳහා නිරන්තරව දියුණුවීමේ ආකල්පයන් ඇති කිරීම ශාරීරික මානසික සෞඛ්‍යයට අදාල වන පරිදි විවේකය. විනෝදය ප්‍රයෝජනවත්ව උපයෝගි කර ගැනීම. පරිසර සංරක්ෂණය උදෙසා නිර්මාණශිලිව සහභාගි වීමේ කැමැත්ත ඇති කිරීම ආදී වශයෙන් ළමයින් ජීවත් වන පරිසරය තුළ දියුණු වීමටත් පරිසරය වඩා ශක්තිමත් කිරීමට හැකියාවක් ඔවුන් තුළ ඇති කිරීමට අධ්‍යාපනයෙන් ඉඩ ප්‍රස්ථා සැළසිය යුතුය.

මානව සම්පතක් වූ සෑම ළමයෙකුගේම යම් සහජ දක්ෂතාවයන් සැඟවී පවතී. මානව සම්පත් හඳුනා ගැනීම, දක්ෂතා ඇති කිරීම සඳහා පාසල යම් සහායක් දී නැණස පෑදීම කළ යුතු වේ. ජාතියේ කොඳු නාරටිය අධ්‍යාපන ක්‍රමය බව මීට කලින් සඳහන් කරන ලද්දේ එබැවිනි.

ඉහත සඳහන් ආකාරයට විවිධ වර්ගීකරණයන්ට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක අධ්‍යාපන ක්‍රමය තුළ දක්නට ලැබෙන විෂමතා පිළිබඳව හඳුනා ගනිමින් ඒවා සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියටම බලපා ඇති ආකාරය හඳුනාගත යුතුය. මේ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කලාපය තෝරා ගතිමි. ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන විවිධ වෙනස්කම් ග්‍රාමීය පරිසරයක් වන වලස්මුල්ල කලාපයේ පාසැල් තුළ කෙතරම් දුරට ක්‍රියාත්මක වෙනවාද ? සමස්ත සමාජය තුළ දක්නට ලැබෙන තත්ත්වයන් මෙම පාසැල් තුළ කොතරම් දුරට දක්නට ලැබේද යන්න මෙහිදී විශේෂයෙන් සොයා බැලේ.

## 1.2 අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ

පාසැලේ සිට විශ්ව විද්‍යාලය දක්වා ක්‍රමවත්ම සකස් කරන ලද විෂය නිර්දේශයානුකූල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් මත පවතින ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කර සිසු අධ්‍යාපනය නගා සිටුවීම මෙහි අරමුණු අතර ප්‍රධාන වේ. එමෙන්ම ජාතික අධ්‍යාපන ක්‍රමය ආශ්‍රිතව පවතින ගැටළු නිරීක්ෂණය කොට සමස්ත ශිෂ්‍ය පරපුර අධ්‍යාපන ක්‍රියාවලියට සහභාගි කරවීම ද අරමුණු අතර ප්‍රධාන වේ.

එමෙන්ම අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන මානව හා භෞතික සම්පත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට උචිත ලෙස සමායෝජනය කිරීමට ද මඟ පෙන්වීම ඉතා වැදගත් වේ. නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීයව අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඇති වී තිබෙන වෙනස්කම් හඳුනාගෙන ඒ සඳහා විකල්ප මාර්ග යොදා සම අධ්‍යාපන අවස්ථා ඇති කිරීමට මඟ පෑදීම ඉතා වැදගත් අරමුණකි. ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සකස් කර ඇති විෂය මාලාව විභාග ඉලක්ක කරගෙන පැවතීමේ වත්මන් රටාව තුළ ඇති වී තිබෙන වෙනස්කම් සොයා බැලීම ද වැදගත් අරමුණකි. එපමණක් නොව ශ්‍රී ලංකාවේ නව අධ්‍යාපන ප්‍රවනතා ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපා ඇති ආකාරය සොයා බැලීම ද ඉතා වැදගත් අරමුණකි. පාසල් විෂය මාලා කළමනාකරණයෙහි ඵලදායි ලෙස නියමුකරණය හා ඇගයීම් උපයෝගි කර ගැනීමෙන් අවශ්‍යතාවයන් ද්විතියික අධ්‍යාපනයේ වෙනස්කම් කෙරෙහි බලපා ඇත්තේ කෙසේදැයි සොයා බැලීම තවත් වැදගත් අරමුණකි. ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයේ වෙනස්වීම් සොයා බලා මාර්ගෝපදේශන සැළසීම මෙහි තවත් අරමුණකි.

ඉහත සඳහන් ආකාරයට සමස්ත පාසල් පද්ධතිය තුළ ඇති වෙනස්කම් හඳුනාගෙන එම ගැටළු මඟ හැරවීමට අවශ්‍ය මාර්ග සෙවීම හා අධ්‍යාපනය නගා සිටුවා වර්තමාන ජීවන අභියෝගයන්ට මුහුණදීම් වස් විකල්පයන් හා නවීකරණයන් කෙරෙහි මාර්ගෝපදේශනය ලබා දීම මෙහි පරමාර්ථ වශයෙන් දැක්විය හැකිය.

## 1.3 අධ්‍යයනයේ වැදගත්කම

ජාතියේ දරුවන්ගේ අවශ්‍යතා සන්තර්පණයට ඉවහල් වන ආකාරයේ උසස් අධ්‍යාපනයක් ලබාදීම එම ජාතියේ පරම යුතුකමකි. එයට හේතුව මෙම ව්‍යායාමය ජාතියේ අනාගත අභිවෘද්ධියට ඉවහල් වන බැවිනි. මෙම ව්‍යායාමයේ දී සියළුම සිසුන් අධ්‍යාපන ක්‍රියාවලියට සහභාගි වී ඇද්ද යන්න සොයා බැලීම ඉතා වැදගත් වේ. නමුත් ශ්‍රී ලංකාවේ මෙම ඉගෙනුම් හා සම්බන්ධ අධ්‍යාපන පද්ධතිය විශාලය. සුවිශාලය. සංකීර්ණය. ශ්‍රී ලංකාවේ සෑම ගම් දනව්වක් පාසා විසිරී ගිය විධිමත් පාසල් 10191 මෙම සංකීර්ණ බව මත එකට බැඳී සිටී. ඇතැම් පාසල් නාගරික, ගම්බද යනුවෙන් අන්ත දෙකක වේ. තවත් කොටසක් කඳුකර හා වෙරළාසන්නව පිහිටා ඇත. මෙසේ දිවයින පුරා විසිරී ගිය 10191 පාසල් සංඛ්‍යාවෙහි ගුරුවරු ලක්ෂ 2 කට ආසන්න ප්‍රමාණයක් සිටී. ශිෂ්‍ය සංඛ්‍යාව හතලිස් තුන් ලක්ෂයකට ආසන්න වී ඇත. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට අනුව අවුරුදු 05-14 ත් දක්වා අනිවාර්ය පාසල් යා යුතු වයසේ අය 14% ක් පාසල් නොයති. අධ්‍යාපනය සහ පුහුණුව 1993 - පිටු 76-90

ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන ප්‍රතිපත්ති තුළින් සැමටම සමාන අධ්‍යාපනයක් ලබා දීමට උත්සාහ දැරුවද ක්‍රියාත්මක අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී විශාල වශයෙන් සම අසමානතා වසර පුරාම ක්‍රියාත්මක වේ. ශිෂ්‍යයන් ඉතා විශාල සංඛ්‍යාවක් එක් වසරකට ඇතුළත් වුවද පූර්ණ පාසල් චක්‍රය සම්පූර්ණ කරන්නේ ඉන් 50% බව අනාවරණය වී ඇත. ශ්‍රී ලංකාව වැනි රටවල ශිෂ්‍යයන්ට අවශ්‍ය නිපුණතා ප්‍රගුණ කිරීමේ මූලාශ්‍රය පාසැල්ය. එබැවින් පාසල ඵලදායි පාසලක් කිරීමට ජාතික ප්‍රමුඛතා ලේඛනයේ ඉහළම තැන හිමි විය යුතුය.

ගැමි දරුවන් තුළ ඇති සහජ දක්ෂතා, හැකියා, ලැදියා අපමණය. බුද්ධි මට්ටමින් ඉහල තත්ත්වයක සිටී. ඔවුනට අවශ්‍ය පහසුකම් නිසි පරිදි ලැබෙන්නේ නම් එම දක්ෂතා ප්‍රගුණ කරගෙන උගතුන්, බුද්ධිමතුන්, නිර්මාණකරුවන් ලෙස සමාජයට පිවිසීම අපහසු කාර්යයක් නොවේ. එහෙත් බොහෝ පාසල්වල ඔවුන්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රය තීරණය වී ඇත්තේ එම පාසල් තුළ පවතින පහසුකම් මතය. පාසලේ උගන්වන විෂයමාලා කුමක් වුවත්

ඔවුන් ඒවා අකමැත්තෙන් හෝ වැළඳගත යුතුව ඇත. එම විෂයයන් ඉගෙනීම සඳහා අවම පහසුකම්වත් නොමැති බැවින් පාසල උරුමකරදී ඇති ප්‍රමාණයෙන් ඒවා භාරගත යුතුව ඇත. මේ ආකාරයට අධ්‍යාපන සම්පත් අවිධිමත්ව බෙදීයාම නිසා සම අධ්‍යාපන අවස්ථා නොලැබී යාම, ප්‍රාදේශිය අධ්‍යාපන විෂමතා නිසා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීමට දරන තරඟකාරිත්වය, විෂයමාලාවේ විෂමතා විභාග ඇගයීම් ක්‍රම වලත් දුර්වලතා නිසා අසමත් වන්නන්ගේත්, අතරමග පාසල් හැරයන්නන්ගේත්, සංඛ්‍යාව ඉහළයාමත් උසස් අධ්‍යාපනය සීමාවීමත්, රැකියා වියුක්ති ගැටළුව, ආදී විෂමතා නිසා අද ඉගෙනුම් ලබන දරුවෝ ශාරිරික මානසික පිඩනයට පත්ව ඇති අතර දෙමාපියෝ අධික ලෙස වියදම් කිරීමට පෙළඹීමෙන් දැඩි ආර්ථික පීඩනයකට ගොදුරුවී සිටිති.

මෙවන් පසු බිමක් තුළ ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඇති වී තිබෙන විවිධ වෙනස්කම් සොයා බැලීම හා ඒ පිළිබඳව අවධානයට යොමු කිරීම කාලෝචිතව වැදගත් වනු ඇතැයි මාගේ හැඟීමයි. අති දුෂ්කර දිස්ත්‍රික්කයක් වශයෙන් පවතින හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් තුළත් සමස්ත පාසල් සමාජය තුළ දක්නට ලැබෙන ලක්‍ෂණ කෙතරම් දුරට දක්නට ලැබෙනවා ද නාගරික, අර්ධ නාගරික හා අති දුෂ්කර පාසල් ඇසුරෙන් සොයා බලා ඒ පිළිබඳව බලපාන සමාජ හා මනෝමූලික සාධක සොයා බැලීම සඳහා මෙම පර්යේෂණය තෝරා ගතිමි.

## 1.4. මූලාශ්‍ර හා ක්‍රමවේදය

මෙම පර්යේෂණ නිබන්ධය සඳහා ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර ප්‍රයෝජනයට ගනු ලැබිණ. සෑම සමාජ ශාස්ත්‍රයකම ග්‍රන්ථාරූඪ මූලාශ්‍ර ප්‍රයෝජනයට ගැනීම ඉතා වැදගත් අංගයක් වේ. මූලාශ්‍ර මූලික හා ද්විතියික මූලාශ්‍ර වශයෙන් කොටස් දෙකකි. මෙම මූලාශ්‍ර මගින් පර්යේෂකයා කරනු ලබන පර්යේෂණයන්ට ආලෝකයක් හා පිටුවහලක් ලබා ගැනීමට (රත්නපාල 1995 පිටු 45-47) හැකියාව ඇත.

ශ්‍රී ලංකාවේ ද්විතියික අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන් කිරීමේදී ඒ හා සම්බන්ධව සෘජු ලෙස පොත්පත් භාවිතයට ගත් අතර පරිශීලනය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද පොත්පත් ද හමුවිය. ඊට අමතරව ළමා අධ්‍යාපනය හා මානසික සංවර්ධනය සම්බන්ධ පොත්පත් පරිශීලනය කරනු ලැබිණ. තවද සමාජ විද්‍යා විශ්ව කෝෂය අධ්‍යාපනය හා සම්බන්ධ කන්නන්ගර වාර්තාව. සිංහල විශ්ව කෝෂය ආදිය මගින් මෙම පර්යේෂණයන්ට අවශ්‍ය ලිඛිත මූලාශ්‍ර ගත තොරතුරු ආදි පොත්පත් ලිපි ලේඛන හා සඟරාද ප්‍රයෝජනයට ගෙන දත්ත ලබා ගැනීම කරනු ලැබිණ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අධ්‍යාපන කළාපය මා මේ සමීක්ෂණය සඳහා තෝරාගත් අධ්‍යාපන ක්ෂේත්‍රය වේ. එහි පාසල් 90 ක් පමණ ඇත. එය පහතින් දැක්වේ.

| පාසල් වර්ගය | පාසල් ප්‍රමාණය |
|---|---|
| 1 ඒ. බී. පාසල් | 05 |
| 1 සී. පාසල් | 25 |
| 2 වර්ගයේ පාසල් | 47 |
| 3 වර්ගයේ පාසල් | 13 |
| එකතුව | 90 |

වගු අංක 01

(වලස්මුල්ල අධ්‍යාපන කලාපීය සංවර්ධන සැලසුම් ඒකකය 2002)

පාසල් 90 ක්ම පවතින වලස්මුල්ල අධ්‍යාපන කළාපයේ පාසල් අතරින් පාසල් 4 ක් මා මේ සඳහා තෝරා ගතිමි. එය වගු අංක දෙකෙන් පැහැදිලි වේ.